උරුමයක උල්පතින් හිරිගඩු සෑයට විශ්‍රාම ශාලාවක්

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන "උරුමයක උල්පත" සංකල්පය වැඩ සටහනේ සම්බන්ධීකරණයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වෙතිහාසික "හිරිහඩුසෑය"පුදබිමට පැමිණෙන බැතිමතුන්ගේ පහසුව පිණිස දෙමහල් විශ්‍රාම ශාලාවක් ඉදිකිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව අග්ගමහා පණ්ඩිත කොටගොඩ ධම්මාවාස අනුනායක ස්වාමීන් වහන්සේ හා "හිරිහඩුසෑය" විහාරාධිපති දෙවිනුවර චනිදිම ස්වාමීන් වහන්සේගේ ආශීර්වාද මැද විශ්‍රාමශාලාව ඉදිකිරීමේ කටයුතු මොහොතින් ආරම්භ විය.

ඉකුත් 14 වැනිදා එහිදී "උරුමයක උල්පත" ලේකම් හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක කාර්යාලයේ අධ්‍යක්ෂ ආර්.ඒ.ඩී.සිරිසේන හා ත්‍රිකුණාමලය මහ දිසාපති මේජර් ජනරාල් රංජිත් ද සිල්වා යන මහත්වරුන් මංගල පස්පිඬැල්ල කැපූ අවස්ථාව.

මෙම අවස්ථාවට ත්‍රිකුණාමලය "22" සේනාංකාධිපති බ්‍රිගේඩියර් අරුණ වන්නිආරච්චි, "22" බලසේනාධිපති කර්නල් සෙනෙවිරත්න, සිවිල් ආරක්ෂක සේවා බල නිලධාරි කර්නල් හදුකුමාර, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් උමා මහේෂ්වරන්, පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් සුනෙත් පීතේන්ද්‍ර යන මහත්වරුන්ද සහභාගි වූහ.

ජෝන් කීල්ස් හෝල්ඩිං සමාගම හා ලංකා දුම්කොළ සමාගම එක්ව මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 6.5ක මූල්‍ය පරිත්‍යාගයක් කර ඇති අතර, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත සිවිල් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙහි ඉදිකිරීම් කටයුතු කරනු ලබයි.